**හම්බන්තොට ප්‍රාදේශීය සභාව - 2021**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1. තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

--------------------------------------------------------------------------

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේදී රු. 5,723,490 ක් වූ ප්‍රාග්ධන වියදම් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් ප්‍රාග්ධන වියදම් එම වටිනාකමින්ම අඩුවෙන් දැක්වුණි. | | වියදම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති කර්මාන්ත ණයගැති ශේෂය තුළ අධි ඇස්තමේන්තු කිරීම් හා ගෙවීම් නිමකළ කර්මාන්ත 06 ක් වෙනුවෙන් රු. 3,535,082 ක් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | | ණයගැතියන් නිවැරදිව ගිණුම් ගත කල යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු. 1,622,643 ක් වූ ඉන්වෙන්ට්‍රිගත කළ යුතු භාණ්ඩ ඒකක 573 ක් ජංගම නොවන වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉන්වෙන්ට්‍රි භාණ්ඩ නිවැරදිව ගිණුම් ගත කල යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභා බල ප්‍රදේශයට අයත් නොවන බැරගම පාර වරිපනම් බල ප්‍රදේශයෙන් ලැබිය යුතු රු. 105,769 ක් වූ වරිපනම් බදු ලැබිය යුතු ශේෂයක් ලෙස වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | | ලැබියයුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති වටිනාකම රු. 78,045 ක් වූ ඩීසල් ලීටර් 645 ක් අවසාන තොගය ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | | අවසන් තොගය නිවැරදිව ගණනය කර ගිණුම්ගත කල යුතුය. |

**1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 20,881,317 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු. 24,230,835 ක අසමානතා පැවතුණි. | කොන්ත්‍රාත් තැන්පත් වෙනස පිලිගන්නා බවත්, මුද්දර ගාස්තු හා උසාවි දඩ සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාගෙන පොතෙන් ඉවත් කරමි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 44,442,002 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,698,785 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් ඒකක 913 කින් ලැබිය යුතු වරිපනම් බදු රු.890,175 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර හිගයෙන් රු.165,490 ක් රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු ශේෂයක් විය. | ක්ෂේත්‍ර දින යොදාගනිමින් හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කරන බවත්, රජයේ දේපළ වලින් ලැබිය යුතු හිඟ මුදල් ගෙවීම් කරනමෙන් ලිපි මඟින් දැනුම් දුන්නෙමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කරුණු විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**3.1** **හඳුනාගත් පාඩු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සභාව සතු කඩ කාමර 12ක් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ 2018 ජනවාරි 26 දිනැති තක්සේරු වාර්තාව අනුව කුළී අයකිරීමට කටයුතු නොකර 2018 මැයි 18 දිනැති සභා තීරණය මත කුළී අයකිරීම නිසා 2018 වර්ෂයේ ජූලි මස සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සභාවට අහිමි වූ කුළී ආදායම රු. 604,000 ක් විය. | 2018 වර්ෂයේදී ලද තක්සේරු වාර්තාව මහා සභාව පිළිනොගෙන සභාව තීරණය කල කඩ කුලියක් අයකළ බවත්, 2022 වර්ෂයේදී නව තක්සේරුවක් සිදුකලද එම වාර්තා මෙතෙක් සභාවට නොලැබුණු බව දන්වමි. | සභා අරමුදලට වූ පාඩුව කඩිනමින් අයකළ යුතුය. |

**3.2** **නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| කොම්පෝස්ට් අංගනය සඳහා වටිනාකම රු. 671,000 ක් වූ බහුකාර්යය කැබලිකරණ යන්ත්‍රයක් හා රු. 930,600 ක් වූ කොම්පොස්ට් හලන යන්ත්‍රයක් 2021 දෙසැම්බර් 15 දින මිලදීගෙන තිබුණු අතර එම යන්ත්‍රවල වගකීම් කාලය මාස 06 ක් වූයෙන් විගණිත දිනය වූ 2022 ජනවාරි 12 දින වන විටත් එම යන්ත්‍ර සවිකර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම යන්ත්‍ර ක්‍රියාකරවීම සඳහා තෙකලා විදුලිය ලබා දෙනමෙන් විදුලි බල මණ්ඩලයෙන් ඉල්ලීම් කළ බවත්, විදුලි සැපයුම මෙතෙක් නොලැබීම මත ක්‍රියාත්මක කළ නොහැකිවූ බව දන්වමි. | වත්කම් මිලදී ගත් අරමුණු ඉටුකර ගැනීම සඳහා යොදා ගත යුතුය. |

**3.3** **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | මයුරපුර සතිපොළ වාහන නැවතුම්පොළ ඉදි කිරීමේ කර්මාන්තය 2021 සැප්තැම්බර් 09 දින රු. 7,902,800 කට ගිවිසුම්ගතවී 2021 දෙසැම්බර් 07 දිනට වැඩ නිම කළ යුතු කර්මාන්තයෙන් සියයට 46 ක් නිමකර තිබූ අතර විගණන දිනය වූ 2022 | මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර මාර්ගයේ තිබූ විදුලි කණු ඉවත් කිරීමට කාලයක් ගත වීම, කම්කරුවන් සොයාගැනීමේ අපහසුව හා අමුද්‍රව්‍ය හිඟය නිසා ව්‍යාපෘතිය ආදාල දිනට නිම | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ජනවාරි 12 දින වන විටත් එකතු වටිනාකම රු. 4,221,337 ක් වූ වැඩ විෂයයන් 08 ක් ඉටුකර නොතිබුණි. | කිරීමට නොහැකි වූ බව දන්වමි. | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් රු. 465,253 ක වියදමින් බොරළු යොදා සංවර්ධනය කළ ජුල්පල්ලම විමලසේන මයාගේ නිවස අසළින් යන මාර්ගය කිලෝමීටර් ලක්ෂයේ වැඩසටහන යටතේ කාපට් අතුරා සංවර්ධනය කර තිබීමෙන් සභා අරමුදලින් දරන ලද මුළු වියදම නිශ්කාර්ය වියදමක් විය. | කර්මාන්තය ක්‍රියාත්මක කිරීමට 2021 පෙබරවාරි මස ගිවිසුම්ගත වූ බවත්, කිලෝමීටර් ලක්ෂයේ වැඩසටහන යටතේ මෙම මාර්ගය සංවර්ධනය කිරීම පිළිබඳව සභාව දැනුවත්ව නොසිටියෙමි. | ව්‍යාපෘති තෝරා ගැනීම නිසි ඇගයීමකට අනුව සිදුකළ යුතුය. |